**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය - 2023**

**-----------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට මුළු ණයහිමි ශේෂය රු.286,739,143 ක් වූ අතර ඒ තුළ වර්ෂ 4 ඉක්මවූ එකතු වටිනාකම රු.113,713,579 ක ණයහිමි ශේෂයක් පැවති අතර එම ණයහිමි ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ආයතනය විසින් ගෙන නොතිබුණි. | ණයහිමියන් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳ කටයුතු කිරීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මුදල් හා පාලන) ගේ සහභාගීත්වයෙන් යුත් කමිටුවක් පත් කර ඇති අතර මේ වන විට එහි කටයුතු සිදු කරමින් පවතින බව | දීර්ඝ කාලීන ණයහිමි ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තියෙහි (අ), (ආ) | මුදල් අමාත්‍යවරයාගේ හා අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2019 හා 2023 වර්ෂවලදී එකතුව රු.203,876,407 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතු ගිණුම් තුනක ආරම්භ කරන බව සහ සියලුම ස්ථාවර තැන්පතු 1995 අංක 29 දරන ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතන පනත අනුව සිදුකර ඇති අතර ඒ සඳහා පාලක සභාවේ නිසි අනුමැතියන්ද ලබාගෙන ඇති බව | මුදල් පනතේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 (2) හා (3) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති වර්ෂ 2 ඉක්මවූ රඳවා ගැනීම් රු.12,778,117 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වර්ෂ දෙක ඉක්මවූ ඉකුත් තැන්පතු සඳහා සුදුසුකම් පරීක්ෂා කොට අදාල ගිණුමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ප්‍රවාහන පහසුකම් ලබා දිම සඳහා හිමිකමක් නොමැති නිලධාරියෙකු වෙත 2019 වර්ෂයේ සිට ආයතනය විසින් ප්‍රවාහන පහසුකම් සපයා තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා පමණක් ඒ වෙනුවෙන් රු.687,965 ක ඉන්ධන වියදමක් දරා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රවාහන පහසුකම් ලබාදීම මින් ඉදිරියට සිදුකරනු ලබන බව. | චක්‍රලේඛයට අනුකූලව ප්‍රවාහන පහසුකම් සැලසීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.97,086,919 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.211,938,598 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.309,025,517 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතිය මගින් ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ රු.7,981,000 කට මිලදී ගත් කියවීම් පුටු 400ක් සහ කියවීම් මේස 200 ක් නියමිත පිරිවිතරයන්ට අනුකූලව සපයා නොතිබීම හේතුවෙන් භාවිතයට ගැනීමකින් තොරව මිලදීගත් දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ගම්පහ උසස් තාක්ෂණ ආයතනයේ නේවාසිකාගාර කාමර තුල තබා තිබුණි. | විගණන කමිටු නිර්දේශය අනුව එම භාණ්ඩ නියමිත පිරිවිතරයන්ට අනුව සකස් කර දී මුදල් ලබාගන්නා ලෙසත් එසේත් නොමැති නම් ඒවා ඉවත්කර ගන්නා ලෙසත් ඉවත් කර නොගතහොත් ඒවා උසස් තාක්‍ෂණ ආයතනය වෙත පවරාගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව සැපයුම්කරුට ලිපියක් මගින් දැනුවත් කිරීම සිදුකර ඇති බව. | පිරිවිතරයන්ට අනුකූලව සකස් කර ගැනීමට හෝ රඳවා ඇති එම භාණ්ඩ ඉවත් කර ගැනීමට අදාල ආයතනය දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විදුලි වියදම අවම කර ගැනීමේ අරමුණින් 2017-2021 අතර කාලපරිච්ඡේදය තුල දෙහිවල කුරුණෑගල,ගම්පහ,මහනුවර උසස් තාක්ෂණ ආයතනවල රු.44,573,400 ක වියදමින් ස්ථාපිත කර තිබූ සූර්ය පැනල බලශක්ති පද්ධතීන් සඳහා තොග විදුලි සම්බන්ධතාවය ලබා නොගැනීම හා නඩත්තු කටයුතු සඳහා ගිවිසුම්වලට එළඹ නොතිබීම හේතුවෙන් මෙම පද්ධති ස්ථාපිත කිරීමේ අරමුණු හා ප්‍රතිලාභ අත්කර ගැනීමට නොහැකි වී තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ව්‍යාපෘති වලින් උපරිම ප්‍රයෝජනය ලබාගත හැකි ආකාරයෙන් හා නඩත්තු කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමකට එළඹිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා රු.71,120,000 ක් වූ ඇස්තමේන්තුගත ආරක්ෂක සේවා වියදම නොසලකා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම හා ගිවිසුම් ගතවීම හේතුවෙන් ඇස්තමේන්තුගත වියදම ඉක්මවා රු.20,691,402 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. | රු.මිලියන 20.6 ක අතිරේක ප්‍රතිපාදන භාණ්ඩාගාරය මඟින් ලබාගැනීමට නොහැකි වූ බැවින් ආයතනයේ ඉපැයීම් වලින් පියවා දැමීමට කටයුතු සිදුවෙමින් පවතින බව. | ප්‍රසම්පාදන කටයුතු අනුමත අයවැය ප්‍රතිපාදන සීමාවන් යටතේ සිදු කිරීමට වගබලාගත යුතුය. |
| (ඈ) | ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල පවත්වන ලද ඩිප්ලෝමා ප්‍රධානෝත්සව සඳහා සිසුන්ගෙන් අයකල යුතු මුදල් ප්‍රමාණය නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් එම අයකළ මුදලින් රු.15,507,633 ක් ඉතිරි කිරීමේ ගිණුමක රඳවාගෙන තිබුණි. | කළමනාකරණය විසින් දැඩි පාලනයකින් යුතුව වියදම් දැරීම හේතුවෙන් අපේක්ෂිත වියදමට වඩා සත්‍ය වියදම් අඩු වූ බවත් ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය සඳහා ශිෂ්‍යයකුගෙන් අයකරන මුදල අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කමිටුවේ නිර්දේශයන් හා පාලක සභාවේ අනුමැතියෙන් සිදු කරනු ලබන බව | සිසුන්ගෙන් අයකල යුතු මුදල් ප්‍රමාණය නිවැරදිව ඇස්තමේන්තු කර ලබාගතයුතු අතර ඉතිරි මුදලක් වේ නම් ආපසු ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | පසුගිය වර්ෂ 03 ක කාලය තුල ආයතනය විසින් පාඨමාලා සඳහා බඳවා ගැනීමට අදාල ගැසට් නිවේදන මාස 8 සිට මාස 9 අතර කාල ප්‍රමාදයක් සහිතව නිකුත් කිරීම හා ඵලදායී ප්‍රචාරණ මාධ්‍යයක් තෝරා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් පාඨමාලා සඳහා ශිෂ්‍යයන්ගේ ඉල්ලුම් කිරීම් පිළිවෙලින් 28,000 ක් 21,701 ක් හා 15,801 ක් ලෙස ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රමිකව අඩුවී තිබුණි. | 2020/2021 වර්ෂ දෙක තුල කොවිඩ් වසංගතය ව්‍යාප්ත වීම හේතුවෙන් පාඨමාලා නිසිකලට අවසන් කිරීමට හැකිවී නොතිබුණි. එබැවින් නැවත අලුත් සිසුන් කණ්ඩායමක් බඳවා ගැනීමට ඉඩ පහසුකම් නොමැතිවීම තුල මෙම සිසුන් බඳවා ගැනීම මාස 8 ක් 9 ක් අතර ප්‍රමාදයට හේතු වූ අතර රට තුළ වූ ආර්ථික දුෂ්කරතා මත සිසුන් පාඨමාලාවලට යොමුවීමේ අඩුවක් සිදු වී ඇති බව. | පාඨමාලා සඳහා ඉලක්කගත කණ්ඩායම් හඳුනාගෙන දැනුවත් කිරීමේ වැඩසටහන් මඟින් බඳවා ගැනීමේ කටයුතු කළ යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විධිමත් පරිදි ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමකින් තොරව යාපනය උසස් තාක්ෂණ ආයතනය විසින් ඉදිකිරීමට යෝජිත සිව් මහල් ගොඩනැගිල්ලක් සඳහා 2016 වර්ෂයේ දී රු.36,989,498 ක අත්තිකාරම් මුදලක් හා 2017 වර්ෂයේදී රු.13,941,163 ක අන්තර් ගෙවීමක් සිදු කර තිබුණද ඉඩමේ නීත්‍යානුකූල අයිතිය නොමැතිවීම හේතුවෙන් ඉදිකිරීම් නතර කිරීමෙන් දරන ලද වියදම නිෂ්කාර්යය වියදමක් වී තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවට අදාල රු.8,330,743 ක් වූ කාර්යසාධන සුරක්ෂණය හා රු.33,322,972 ක් වූ අත්තිකාරම් සුරක්ෂණය කාලය දීර්ඝ කර නොගැනීම හේතුවෙන් 2019 ඔක්තෝබර් | ඉඩමේ අයිතිය පිළිබඳ ප්‍රාදේශිය ලේකම් විසින් ලබා දුන් සනාථ කිරීම අනුව ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ අතර එම අවස්ථාවේ අධිකරණයේ ප්‍රශ්නගත කරුණක් ඉදිරිපත් විය.මේ සම්බන්ධයෙන් කොළඹ අභියාචනාධිකරණයේ පැවති නඩුව දැනට අවසන්ව ඇති අතර යාපනය දිසා අධිකරණයේ පවතින නඩුවට අදළව ඉදිරි පියවර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අයිතිය තහවුරු කර ගැනීමෙන් පසු කඩිනමින් ගොඩනැගිල්ලේ අවශ්‍යතාවය හඳුනාගෙන ඉදිකිරීම් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | 21 දිනෙන් කල් ඉකුත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පවරා තිබූ නඩු කටයුත්ත 2023 ඔක්තෝබර් අවසන්වී තිබුණද 2024 සැප්තැම්බර් වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි. | | |
| (ආ) | නිල නිවාසයක් හා ක්‍රීඩා පිටියක් තැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට අයත් රු.18,305,976 ක් වටිනා රත්නපුර පිහිටි ඉඩම වෙනුවෙන් මූලික තැන්පත් ලෙස රු.1,000,000 ක් 2016 දෙසැම්බර් 30 දින අධිකාරියට ගෙවා තිබුණි. එහෙත් ඉතිරි මුදල් ගෙවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම පවරා ගැනීම අනවශ්‍ය බව හා ඉඩම නැවත නාගරික සංවර්ධන අධිකාරියට භාරදීමටත් ගෙවා ඇති රු.1,000,000 ක මුදල නැවත ලබාගැනීමට හැකිද යන්න සොයාබලන ලෙස පාලක සභා රැස්වීමේදී තීරණය වූ බව. ඒ අනුව අදාළ කටයුතු කඩිනමින් සිදුකරමින් පවතින බව. | ඉඩම සඳහා ගෙවා ඇති මුදල නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පුස්තකාල කටයුතු නව තාක්ෂණයෙන් යුතුව පවත්වා ගෙන යාම සඳහා ස්ථාපිත KOHA පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා රු.1,013,315 ක් වැය කර තිබුණද මෙම පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයට පත් නොකිරීම හේතුවෙන් දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අදාලව තවත් එක් පුහුණු වැඩමුළුවක් පැවැත්වීමට නියමිතව තිබූ නමුත් කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ රජයේ වියදම් සීමාකිරීම හේතුවෙන් එම වැඩමුළුව අවසන් කරගත නොහැකි වූ අතර අදාල පුහුණු වැඩමුළුව පැවැත්වීමේ මූලික වැඩ කටයුතු සංවිධානය කරමින් පවතින බව | පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වයට කඩිනමින් පත්කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාමේ අරමුණ සහිතව දෙහිවල උසස් තාක්ෂණ ආයතන භූමියේ රු.20,486,321 ක වියදමින් ඉදිකරන ලද ගොඩනැගිල්ලෙහි මහල් 3 ක වැඩ අවසන් කර 2017 පෙබරවාරි 21 දින ආයතනය වෙත භාරදී තිබුණ අතර ඉතිරි මහල් දෙකෙහි වැඩ නිම නොකිරීම හේතුවෙන් එම ගොඩනැගිල්ල භාර දුන් දිනයේ සිට නිෂ්කාර්යව පැවතුණි. අපේක්ෂිත පරිදි ගොඩනැගිල්ල නිම නොවීම හේතුවෙන් ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම සඳහා 2017 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.64,476,564 ක කුළී වියදමක් ආයතනයට දැරීමට සිදුවී තිබුණි.තවද, එම ගොඩනැගිල්ල නවීකරණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.4,251,022 ක් වැය කර තිබුණද 2024 සැප්තැම්බර් 30 දක්වා ප්‍රධාන කාර්යාලයේ කටයුතු එම ගොඩනැගිල්ලේ ආරම්භ කර නොතිබුණි. | මූල්‍ය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් දෙවන අදියරේ ඉදිකිරීම් කටයුතු නතර වූ අතර පාලක සභාවේ එකඟතාවය මත ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින අතර කඩිනමින් නිම කිරීමට බලාපොරොත්තු වන බව | අසම්පූර්ණ ඉදිකිරීම් කඩිනමින් සම්පූර්ණ කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |